www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආන්ඩුව සහ එල්ටීටීඊය අතර ඔස්ලෝ සාකච්ඡා බිඳ වැටේ

## Oslo talks between Sri Lankan government and LTTE collapse

**කේ. රත්නායක විසිනි**

**2006 ජුනි 13**

ශ්‍රී ලංකාවේ ආන්ඩුව සහ දෙමල විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) අතර පසු ගිය සති අන්තයේ දී ඔස්ලෝහි පැවැත්වීමට තිබූ සාකච්ඡා ආරම්භයටත් පෙරදී ම බිඳ වැටින. නෝර්වීජියානු අගනුවරට පැමිනි නියෝජිත දෙපිරිස සාකච්ඡා සඳහා හෝටලයකට කැඳවාගෙන ගිය නමුදු සාකච්ඡා මේසයට වාඩි වූයේ නැත.

නෝර්වීජියානු රාජ්‍ය තාන්ත්‍රිකයන් එල්ටීටීඊයට දොස් පවරන නමුදු, සාකච්ඡා බිඳ වැටීම වනාහී පසු ගිය නොවැම්බරයේ දී ශ්‍රී ලංකාවේ ජනාධිපති ලෙස මහින්ද රාජපක්ෂ තේරී පත් වීමෙන් පසු උත්සන්න කෙරුනු ප්‍රචන්ඩත්වයේ නිෂ්පාදිතයකි. 2002 දී අත්සන් කෙරුනු සටන් විරාම ගිවිසුම වැරහැල්ලක් බවට සහ ප්‍රධාන බලයන්ගේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කෙරුනු සමස්ත සාම ක්‍රියාදාමය අවිනිශ්චිත බවට පත්ව ඇති තතු යටතේ ශ්‍රී ලංකාව නැවත වරක් පූර්න පරිමාන සිවිල් යුද්ධයක අද්දරටම ලගා වී ඇත.

සාම ක්‍රියාදාමයේ විධිමත් පහසුකම් සපයන්නා වන නෝර්වේ රජය, සාම ක්‍රියාදාමය නිරීක්ෂනය කරන ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුවේ ආරක්ෂාව තහවුරු කිරීමේ සීමිත කරුනක් මත දෙපාර්ශ්වය අතර සාකච්ඡාවක් ඉල්ලා සිටියේ ය. මැයි මාසයේ දී ශ්‍රී ලංකාවේ නාවික හමුදා යාත්‍රාවකට එල්ටීටීඊය විසින් එල්ල කෙරුනු ප්‍රහාරයෙන් එහි ගමන් ගත් නිරීක්ෂන කමිටු සාමාජිකයන්ගේ ජීවිත අනතුරට හෙලූ බවට සහ ශ්‍රී ලංකාවේ හමුදාවන් කමිටුවේ ක්‍රියාකාරකම් අවහිර කල බවට නෝර්වීජියානු නිලධාරීහු චෝදනා කලහ.

පුලුල් සාකච්ඡාවන් නැවත ස්ථාපනය කිරීම සඳහා ගනු ලබන උත්සාහයේ මාධ්‍යයක් ලෙස ද මෙමරැ ස්වීම යොදා ගැනීමට අරමුනු කෙරින. තෙවසරක් තුල පලමුවරට ඉහල-පෙලේ සාකච්ඡාවක් ඇති වූයේ පසු ගිය පෙබරවාරි 22-23 දෙදින තුල ජිනීවාහි දී වන අතර, 2002 සටන් විරාම ගිවිසුම පිලිබඳ විශ්වාසය යලි තහවුරු කිරීම හැර අන් කවර කරුනක් සම්බන්ධයෙන් හෝ එකඟතාවක් ඇති කර ගැනීමට එය අසමත් විය. අප්‍රේල් මාසයේ දී තවත් සාකච්ඡා වටයක් පැවැත්වීමට නියමිතව තුබූ නමුදු, දිවයිනේ යුදමය කලාපයේ ඉහල නගින ප්‍රචන්ඩත්වය මධ්‍යයේ පලමුව පමා කෙරුන එය පසුව දින නියමයක් නොමැතිව කල් දැමින.

අරමුනු දෙකම මුලුමනින්ම අසාර්ථක විය. දෙමල සන්නද්ධ කන්ඩායම් විසින් එල්ටීටීඊයට එල්ල කෙරෙන ප්‍රහාරයන්ට මිලිටරියේ ඇති සබඳතාව පෙන්නුම් කරමින් ශ්‍රී ලංකා ආන්ඩුවට වරද පටවන නිරීක්ෂන කමිටු වාර්තාවක් සාකච්ඡාවලට පෙර හෝ ඒ අතර වාරය තුල ප්‍රසිද්ධ කෙරුන හොත් සාකච්ඡාවලින් මුලුමනින්ම ඉවත් වන බවට ශ්‍රී ලංකා නියෝජිත පිරිස තර්ජනය කලේ ය. එල්ටීටීඊයේ නිලධාරීන්ට, භටයින්ට සහ ආධාරකරුවන්ට සන්නද්ධ කන්ඩායම්වලින් එල්ල කෙරෙන ප්‍රකෝපකාරී ප්‍රහාරයන් සමග හෝ එම කන්ඩායම් සමග මිලිටරියේ කිසිම සබඳතාවක් නොමැති බව පෙන්වීම සඳහා හම්පඩ ගැසුනු තර්ක ඉදිරිපත් කිරීමේ උත්සාහයක මහින්ද රාජපක්ෂ ආන්ඩුව දිගට ම යෙදී ගති.

ශ්‍රී ලංකාවේ සාම මහ ලේකම් කාර්යාලයේ ප්‍රධානියා වන පාලිත කොහොන විසින් නායකත්වය දෙනු ලැබූ ආන්ඩුවේ නියෝජිත කන්ඩායමට කැබිනට් ඇමතිවරයකු අන්තර්ගත නොවීම සම්බන්ධයෙන්, එල්ටීටීඊ නියෝජිත කන්ඩයමේ නායක එස්. පී. තමිල්චෙල්වම් තම විරුද්ධත්වය ප්‍රකාශ කලේ ය. මුල් කෙටුම්පතේ පදනම් මත, අඩු මට්ටමේ කෙනෙකු වන එල්ටීටීඊ සාම මහ ලේකම් කාර්යාලටයේ ප්‍රධානි එස්. පුලිදේවන් විසින් එල්ටීටීඊ නියෝජිත කන්ඩායමට නායකත්වය දෙනු ඇතැයි ඔහු යෝජනා කලේ ය. එල්ටීටීඊයේ යෝජනාව ඇසූ සැනින් "ඔබේ මලු අසුරාගෙන ඉක්මනින් ආපසු එන්න" යැයි රාජපක්ෂ පැවසූ බැව් වාර්තාවේ.

රාජපක්ෂගේ ප්‍රතිචාරයේ පුදුම වීමට දෙයක් නැත. ඔහුගේ සුලුතර එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුව පාලනයේ රැඳී පවතින්නේ, යුද්ධය සඳහා උද්ඝෝෂනයේ යෙදී සිටින සිංහල ස්වෝත්තමවාදී පක්ෂ දෙකක් වන ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) හා ජාතික හෙල උරුමයේ (ජාහෙඋ) පාර්ලිමේන්තු සහායෙනි. එල්ටීටීඊයට පක්ෂපාතකම් දක්වන්නේ යැයි චෝදනා කරමින් නෝර්වීජියානු ආන්ඩුවට සහ සටන් විරාම නිරීක්ෂන කමිටුවට විරෝධය පාන ජවිපෙ ඔස්ලෝ සාකච්ඡාවලට එරෙහි විය. පසු ගිය සිකුරාදා ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායම් නායක විමල් වීරවංශ මෙසේ පැවසී යː "නෝර්වීජියානුවන් ඔස්ලෝ සාකච්ඡා සඳහා අපට ඇරයුම් කලේ හුදෙක් ශ්‍රී ලංකාවට ගර්හා කිරීමට යි."

ඊනියා සාම ක්‍රියාදාමයමත් දැන් පවතින්නේ අනතුරේ ය. සාකච්ඡාවන්ට පෙර, මැයි 29 දා, බුෂ් පරිපාලනයේ පීඩනය යටතේ යුරෝපා සංගමය විසින් එල්ටීටීඊය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස විධිමත් ආකාරයෙන්

ප්‍රකාශයට පත් කෙරින. මෙම තහනම, ශ්‍රී ලංකාවෙන් පිටමංවී යුරෝපයේ ජීවත් වන දෙමල ජනයාගේ දේශපාලන පිටු බලය, සහයෝගය සහ මුදල් ආධාර මත බලගතු ලෙස යැපෙන එල්ටීටීඊයට එල්ල කෙරුනු බරපතල ප්‍රහාරයකි.

යුරෝපා සංගමයේ තහනම මගින් "අපක්ෂපාතිත්වය පිලිබඳ බරපතල සැකයක්" නිර්මානය කෙරී ඇතැයි ප්‍රකාශ කරමින් එල්ටීටීඊ නියෝජිත පිරිස නෝර්වේ රජයෙන් ඉල්ලා සිටියේ යුරෝපා සංගමයේ රටවල් නියෝජනය කරන සටන් විරාම නිරීක්ෂන කමිටු සාමාජිකයන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් අය පත් කරන ලෙස යි. යුරෝපා සංගමයට අයත් ස්කැන්ඩිනේවියානු රටවල් තුනක් වන ස්වීඩනය, ඩෙන්මාර්කය සහ ෆින්ලන්තය නියෝජනය කරන සාමාජිකයන් 37ක් සමස්ත සාමාජික සංඛ්‍යාව වන 57 ට අන්තර්ගත වේ. නෝර්වේ රජය ප්‍රකාශ කලේ ඔවුන් විස්ථාපනය කිරීමේ ආස්ථානයක තමා නොසිටින බවයි.

සාකච්ඡා බිඳ වැටීමෙන් අනතුරුව නෝර්වේ අභ්‍යන්තර සංවර්ධන අමාත්‍ය එරික් සෝල්හයිම් මෙසේ ප්‍රකාශ කලේ යඃ "වඩාත් නරක අතට හැරෙමින් පවත්නා තත්වය පිලිබඳ වගකීම දෙපාර්ශ්වය විසින් ගත යුතු යි. ඔවුහු අපේ උපදෙස්වලට විපරීතව ක්‍රියා කරමින් සිටිති. වර්තමාන කාලයේ නෝර්වීජියානු ආරම්භකත්වයක් සඳහා ඉඩ නොමැත". යුරෝපා සංගමයේ තහනම පිලිබඳව ඔහු මෙසේ සටහන් කලේ යඃ "ඔස්ලෝ රැස්වීමට පෙර එල්ටීටීඊයේ ආස්ථානය දෘඩ කිරීමට බලපෑ හේතුවක් ලෙස මෙය පවත්නා බවට සැකයක් නොමැත." 'පෙර නොවූ විරූ ක්‍රියාවක්' ලෙස විස්තර කොට ඇති පරිදි, ජූනි 20දාට පෙර "තීරනාත්මක ප්‍රශ්න පහකට ලිඛිතව ප්‍රතිචාර දක්වන" ලෙස ඉල්ලා නෝර්වේ රජය විසින් ශ්‍රී ලංකාවේ ජනාධිපති රාජපක්ෂට හා එල්ටීටීඊ සංවිධානයට ලිපියක් යවා ඇත. දෙපාර්ශ්වය තව දුරටත් සටන් විරාම ගිවිසුමට කැප වී සිටී ද? සටන් විරාම නිරීක්ෂන කමිටුවේ මෙහෙයුම් තව දුරටත් අවශ්‍ය ද? නිරීක්ෂන කමිටුවේ ආරක්ෂාව පිලිබඳව සහතිකයක් ලබා දෙනවා ද? යන ප්‍රශ්න එයට ඇතුලත් වේ. මෙම ප්‍රශ්න මගින් පෙන්නුම් කෙරෙන්නේ සටන් විරාම ගිවිසුම මුලුමනින්ම බිඳ වැටීමේ ලක්ෂයට ලඟා වී ඇති බවයි.

## යුද්ධය කරා තල්ලුවී යාම

යුද්ධය කරා වේගයෙන් ඇදී යාමේ ප්‍රධාන වගකීම රඳා පවත්නේ ශ්‍රී ලංකාවේ ආන්ඩුව මත ය.ජවිපෙ හා ජාහෙඋයේ ආධාරයෙන් නොවැම්බර් ජනාධිපතිවරනයේ දී රාජපක්ෂ යන්තමින් ජය ගත්තේ ය. මිලිටරියේ අත ශක්තිමත් කරනු වස් සටන් විරාම ගිවිසුම සංශෝධනය කිරීම, පහසුකම් සපයන්නාගේ භූමිකාවෙන් නෝර්වේ ඉවත් කිරීම හා කවර හෝ සාකච්ඡාවක් සඳහා පදනම ලෙස "ඒකීය රාජ්‍යය" යලි තහවුරු කිරීම ආදී කරුනුවලින් සමන්විත වඩාත් ආක්‍රමනශීලී ආස්ථානයක් අන්තර්ගත ආකාරගත මැතිවරන ගිවිසුමක් සඳහා මෙම දෙපාර්ශ්වයම දෘඩ ලෙස බල කර සිටියහ. දිවයිනේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ සඳහා සැලකිය යුතු බලය බෙදාදීමක් අන්තර්ගත කෙරුනු සාකච්ඡා සඳහා වූ පූර්ව පදනමට මෙම අවසන් කොන්දේසිය මගින් වල කැපින.

රාජපක්ෂගේ තේරී පත් වීමෙන් පසු, ආන්ඩුවට හිතවත් දෙමල සන්නද්ධ කන්ඩායම් මිලිටරියේ එලිපිට නොවන සහයෝගය ඇතිව එල්ටීටීඊයට සහ එහි ආධාරකරුවනට එරෙහිව ප්‍රකෝපකාරී ප්‍රහාරයන් මාලාවක් දියත් කලහ. දෙසැම්බරයේ දී, එල්ටීටීඊයට පක්ෂපාතී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන ජෝසප් පරරාජසිංහම් ඝාතනය කිරීමත් සමග ම එල්ටීටීඊයේ ප්‍රතිප්‍රහාරයන් ප්‍රකුපිත විය. පරරාජසිංහම් වෙනුවට නම් කෙරුනු ප්‍රමුඛ එල්ටීටීඊ හිතවාදී දේශපාලනඥයකු වන එස්. විග්නේස්වරන් පසු ගිය අප්‍රේල් 07 වන දින ඝාතනය කිරීමත් සමග ජිනීවා සාකච්ඡාවලින් පසු තාවකාලිකව නැවතී තිබූ ඉහල යන ප්‍රචන්ඩත්වය යලි ඇරඹින.

සටන් විරාම නිරීක්ෂන කමිටු වාර්තාවට අනුව පෙබරවාරි සාකච්ඡා සිට පසු ගිය සතිය දක්වා වූ කාලය තුල ආරක්ෂක හමුදාවන්හි 88ක් ද, එල්ටීටීඊයේ 19ක් ද හා සිවිල් වැසියන් 223ක්ද ඇතුලත් 330 දෙනෙකු ඝාතනය කෙරී ඇත. එල්ටීටීඊය සහ තම සන්නද්ධ සගයන් සමග එක් වූ මිලිටරිය අතර කෙරීගෙන යන "අඩු තීව්‍රතාවයකින් යුත් යුද්ධයක්" ලෙස නිරීක්ෂන කමිටුවමත් හඳුන්වා දෙන මෙම යුද්ධයෙන් දෙසැම්බරයේ සිට මිය ගොස් ඇති සංඛ්‍යාව 680කි.

සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වාර්තාව දෙපාර්ශ්වයට ම චෝදනා කරයි. නමුදු, තත්වය නැවත "මහත් සේ ආතති සහගත" වීමේ සහ ආන්ඩුවේ හමුදාවන්ට එරෙහි "ප්‍රහාරය බලගතු ලෙස යලි ආරම්භ වීමේ" පරිවර්තනීය ලක්ෂ්‍යය ලෙස විග්නේෂ්වරන් ඝාතනයේ වාර්තාව විසින් හඳුනා ගනී. ආන්ඩුව විසින් පාලනය කරන ප්‍රදේශයන්හි සිට එල්ටීටීඊ-විරෝධී සන්නද්ධ කන්ඩායම් විසින් එල්ටීටීඊයට ප්‍රහාර එල්ල කරන බව සඳහන් කරන වාර්තාව, සටන් විරාම ගිවිසුමේ සඳහන් අවශ්‍යතාවන් වන එවන් සන්නද්ධ කන්ඩායම් නිරායුධ කිරීම සම්බන්ධයෙන් මිලිටරිය අසමත් වී ඇති බැව් නිගමනය කරයි.

සාකච්ඡා බිඳ වැටීමෙන් පසු, එල්ටීටීඊය විසින් ආකාරගතව "ඔස්ලෝ ප්‍රකාශයක්" නිකුත් කලේ ය. දීර්ඝ මැසිවිලි මාලාවකින් සමන්විත එය සමස්ත සාම ක්‍රියා දාමයෙන් ඉවත්ව යාමක් ප්‍රකාශ කිරීමකට සමාන වෙයි. අර්ථහාරීව, එම ලේඛනය ලියා ඇත්තේ "දෙමල නිජබිමෙන් සියයට 70ක් ආවරනය කෙරෙන අධිකරන පද්ධතියක් " සහ තමාගේම නීති පද්ධතියක්, ස්වාධීන අධිකරනයක්, පොලිස් බලකායක් සහ පූර්න පරිපාලන යාන්ත්‍රනයක් ක්‍රියාත්මක වන "යථා වසයෙන් පවත්නා දෙමල ඊලම් රාජ්‍යයේ " නාමයෙනි. සමාප්තියේ දී එය යලි තහවුරු කරන්නේ "දෙමල ජාතික ප්‍රශ්නයට විසඳුමක් සෙවීමේ දී එහි පිලිවෙත, ස්වයං-නිර්නය අයිතිය සාක්ෂාත් කිරීම මත පදනම්වන " බවයි.

බුෂ් පරිපාලනය විසින් ගෙන යන "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" ඉලක්කයන් අතරට තමාද ඇතුලත් වනු ඇතැයි යන උත්සුකය මත එල්ටීටීඊය 2002 දී සටන් විරාම ගිවිසුමට එකඟ විය. එක්සත් ජාතික පක්ෂය (එජාප) ආන්ඩුව සමග පැවැත්වූ පලමු සාකච්ඡා වටයේ දී දෙමල ඊලම්හි වෙනම රාජ්‍ය කැබිලිත්තක් සඳහා වූ තම දිගු කාලීන ඉල්ලීම අත් හරිමින්, උතුර සහ නැගෙනහිර " ව්‍යාසෘ ආර්ථිකයක්" - විදේශ ආයෝජකයන් සඳහා ලාභ ශ්‍රම වේදිකාවක් - බවට පරිවර්තනය කෙරෙන්නා වූ, කොලඹ සමග බලය බෙදා ගැනීමකට තමාගේ ඇති කැමැත්ත එල්ටීටීඊය ප්‍රකාශ කලේ ය.

එක්සත් ජනපදය සහ අනෙකුත් බලයන් ඊනියා සාම ක්‍රියාදාමයට පිටුබලය දුන්නේ ශ්‍රී ලංකාවේ මහජනතාව සම්බන්ධයෙන් ඔවුන්ට ඇති උත්සුකය නිසා නොව, ආර්ථිකමය හා මූලෝපායික වසයෙන් වඩ වඩාත් වැදගත් වන කලාපයක සමතුලිතතාව මෙම විසි අවුරුදු ගැටුම මගින් තර්ජනයට ලක්ව ඇති හෙයිනි. සාම ක්‍රියාදාමය හරහා තම අරමුනු සාර්ථක කර ගැනීමට අසමත් වූ බුෂ් පරිපාලනය, එල්ටීටීඊයේ ජාත්‍යන්තර වසයෙන් හුදෙකලා කෙරෙන හා නැවත යුද්ධයක් එලැඹුන හොත් ශ්‍රී ලංකාවේ මිලිටරියට ආධාර කරන බවට තර්ජනය කෙරෙන වඩාත් ආක්‍රමනශීලී ආස්ථානයකට මාරු විය.

සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් සිව් වසරකට පසු, එල්ටීටීඊයට මුහුන දීමට සිදුව ඇත්තේ ආන්ඩුව පැත්තෙන් කුමන හෝ බලයක් බෙදා දීමේ යෝජනාමාලාවක් ඉදිරිපත් කිරීමකින් තොරව ම ජාත්‍යන්තර වසයෙන් "ත්‍රස්තවාදී" සංවිධානයක් ලෙස ප්‍රකාශිත වී ඇති තත්වයකට ය. එල්ටීටීඊය පරීක්ෂාකාරී ලෙස තම දෙමල ඊලම් ඉල්ලීම යලි පන ගැන්වීම සහ එක දිගට කෙරීගෙන යන මිලිටරි ප්‍රකෝපකරනයන් හමුවේ යුද්ධයකට සූදානම් වීම සම්බන්ධයෙන් පුදුම වීමට දෙයක් නොමැත. සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වීමට සූදානම් වන්නේ දැයි එල්ටීටීඊයේ ප්‍රකාශක දයා මාස්ටර්ගෙන් සන්ඩේ ටයිම්ස් පුවත්පත පසු ගිය සෙනසුරාදා විමසූ කල්හි ඔහු පැවසුවේ, යුරෝපා සංගමයේ නියෝජිතයින් සටන් විරාම නිරීක්ෂන කමිටුවෙන් ඉවත් කරන ලෙස එල්ටීටීඊය නෝර්වේ රාජ්‍යයෙන් කල ඉල්ලීමට "ප්‍රතිචාරයක් ලැබෙන තුරු" බලා සිටින බවයි. තීරනාත්මක ප්‍රශ්නවලට ආමන්ත්‍රනය කරනු වස් රාජ්‍යයට ලබා දුන් අවසන් අවස්ථාව ලෙස ඔහු ඔස්ලෝ ප්‍රකාශනය විස්තර කලේ ය.

ශ්‍රී ලංකා ආන්ඩුව ඉතා පැහැදිලිව ම පූර්න-පරිමාන යුස්ධයකට සූදානම් වේ. ජේන්ස් ඩිෆෙන්ස්වීක්ලි හි මෑත වාර්තාවකට අනුව ශ්‍රී ලංකාවේ "පරම ප්‍රමුඛතාවයෙන්" යුතුව ඇ. ඩොලර් මිලියන 60ක වටිනා මිලිටරි සැපයුම් පකිස්ථානයෙන් ඇනවුම් කොට ඇත. මෙයට යුධ ටැංකි, සතුරු-යුධ ටැංකි සොයා පහර දෙන මිසයිල පද්ධති සහ ද්විත්ව යුධහිස්වල අලුත්වැඩියාවන් අන්තර්ගත වේ. පසු ගිය මාසයේ දී, සටන් විරාමය උල්ලංඝනය කරමින්, උතුරට සැපයෙන ඉන්ධන හා සිමෙන්ති සහ වානේ වැනි ඉදිකිරීම් ද්‍රව්‍යයන් මත ආන්ඩුව මගින් තහනමක් පැනැවින. මෙමගින් කලහකාරී තත්වයක තර්ජනය මතු වූ කල්හි, ඔස්ලෝ සාකච්ඡාවන්ට යන්තම් පෙර, "ප්‍රමානවත් තරම්" ඉන්ධන යවන ලෙස රාජපක්ෂ අන කලේ ය.

නෝර්වේ රජයේ ලිපියට රාජපක්ෂ මෙතෙක් පිලිතුරු සපයා නොමැති නමුදු, එමගින් නගා ඇති ප්‍රශ්නවලට විරුද්ධත්වය පල කෙරෙනු ඇති බවට ඇඟවුම් මේවන විට ද ප්‍රකාශ වී ඇත. මේ අයුරින් නිරීක්ෂන කමිටුවේත් පහසුකම් සපයන්නකු ලෙස නෝර්වේහිත් භූමිකාවන් නිමාවක් කරා ගෙන ඒම කඩිනම් කෙරේ. ආන්ඩුවේ ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල ඩේලි මිරර් පුවත්පතට කියා සිටියේ එවන ලද ලිපියතුල ආන්ඩුවටත් ත්‍රස්තවාදී සංවිධානයකටත් සම තත්වයන් ලබා දීමෙන් නෝර්වේ රජය "බරපතල වරදක්" කොට ඇති බව පෙන්වා දීමට රාජපක්ෂ සූදානම් ව සිටි බවයි. කෙසේ නමුදු, මෙයට සම්බන්ධිත ප්‍රත්‍යක්ෂ ඇඟවුම්වලින් පෙන්නුම් කෙරෙන පරිදි මෙම විවාදයේ තර්කනය වන්නේ, ආන්ඩුවමත් " ත්‍රස්තවාදී" සංවිධානයක් සමග සාකච්ඡාවට නොඑන බවයි.

දැනටමත් අවම වසයෙන් ජීවිත 65,000ක් බිලි ගෙන ඇති යුද්ධයකට මුහුන දීමට ශ්‍රී ලංකාවට නැවත සිදුවීම රාජපක්ෂ ආන්ඩුවට පමනක් නොව සමස්ත පාලක ප්‍රභුවටම එරෙහි අධිචෝදනාවකි. කම්කරු පන්තිය බෙදීම සඳහාත්, තම දේශපාලන පක්ෂ සඳහා සමාජ පදනමක් සපයා ගැනීම සඳහාත් ශ්‍රී ලංකාවේ පාලක පන්තිය 1948 නිදහසේ සිට දෙමල-විරෝධී වර්ගවාදය උසිගැන්වීම මත රැඳී සිටි අතර අවසානයේ දී එහි ආනුෂංගික ප්‍රතිඵලයක් ලෙස 1983 දී යුද්ධය පුපුරා ගියේ ය. කම්කරු ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අභිලාෂයන්ට සහ සමාජ අවශ්‍යතාවයන්ට ආමන්ත්‍රනය කිරීමට ඓන්ද්‍රීයවම අසමත් වන තතු තුල, තව තවත් මරනයන් හා විනාශයන් හැර අන් කිසිවක් ගෙන නොඑන භ්‍රාතෘඝාතක යුද්ධයක් කරා වේගයෙන් රට ඇදගෙන යාමට ඔවුහු නැවත වරක් සූදානම් වෙති.

© www.wsws.org